# බස්නාහිර පළාත් සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණන මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, බස්නාහිර පළාත් සභාව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයෙන් දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල සත්‍ය හා සාධරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම.

#### (අ) පළාත් සභා අරමුදල් ගිණුම

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2012 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

#### (ආ) අනෙකුත් ගිණුම්

2012 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| | | 2011 වර්ෂයට අදාලව | | | |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉකුත් වර්ෂ වලට අදාලව ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i). | විසර්ජන ගිණුම් | 26 | 26 | - | - |
| (ii). | ආදායම් ගිණුම් | 30 | 30 | - | - |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 46 | 46 | - | - |
| (iv). | වානිජ අත්තිකාරම් ගිණුම් | 02 | 02 | - | - |
| (v). | වෙනත් අත්තිකාරම් ගිණුම් | 05 | 05 | - | - |
| (vi). | අරමුදල් ගිණුම් | 06 | 06 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| (vii). ප්‍රඥප්ති ගිණුම් | 08 | 04 | 04 | 02 |

### 1.2.1 විගණකාධිපතිවරයාගේ වාර්තා සභාගත කිරීම.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කල දිනය | සභාගත කල දිනය |
|---|---|---|
| 2008 | 2009.12.10 | 2010.02.09 |
| 2009 | 2010.10.26 | සභාගත කර නැත. |
| 2010 | 2012.01.16 | 2012.05.22 |

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 1.3.1 ප්‍රතිපාදන කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 06 ක වැය විෂයයන් 13 ක් යටතේ වූ රු. 1,041,076 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 13 ක වැය විෂයයන් 116 ක් යටතේ රු. 65,315,845 ක ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණි.

(ඇ) ශීර්ෂ 05 ක වැය විෂයයන් වලින් ප්‍රතිපාදන අඩුකර ගැනීමෙන් පසු එම වැය විෂයයන් වලටම නැවත ප්‍රතිපාදන වැඩිකර ගැනීම් අවස්ථා 14 ක් තිබුණි.

### 1.3.2 අග්‍රිම ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාලව නිරවුල් නොකළ අග්‍රිම ශේෂය රු. 207,844,706 ක් වූ අතර, එහි සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ රු. 117,232,054 ක් හා ඉකුත් වර්ෂ වෙනුවෙන් වූ රු. 90,612,652 ක් ඇතුලත් වී තිබුණි.

### 1.3.3 නිරවුල් නොකළ පොදු තැන්පත්

2012 දෙසැම්බර් 31 දිනට පළාත් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ රු. 685,740,786 ක බැර ශේෂයක් පැවති අතර, මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාර කටයුතු නොකළ අවුරුදු 02 ඉක්මවා තිබූ ආයතන 06 ක තැන්පත් ශේෂ වල එකතුව රු. 1,617,464 ක් විය.

### 1.3.4 පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම්

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 15 ක ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්ගෙන් එකතුව රු. 114,466,074 ක ශේෂයක්ද, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් එකතුව රු. 10,585,257 ක ශේෂයක්ද, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් එකතුව රු. 11,641,564 ක ශේෂයක්ද හා හිටපු පළාත් සභා මන්ත්‍රීවරයකුගෙන් රු. 69,742 ක ශේෂයක්ද වශයෙන් රු. 136,762,637 ක් දීර්ඝ කාලයක් තුල අය නොවී පවතින ශේෂ නිරීක්ෂණය විය.

### 1.3.5 ගිණුම් නොසැසදීම්

ඒ ඒ දෙපාර්තමේන්තු වලින් ඉදිරිපත් කරන ලද ගිණුම් හා පළාත් සභා අරමුදල් ගිණුම (පළාත් භාණ්ඩාගාර පොත්) අතර රු. 802,469,812 ක වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විස්තරය | ඒ ඒ දෙපාර්තමේන්තු වල ගිණුම් අනුව ශේෂය<br>රු. | පළාත් සභා අරමුදල් ගිණුම අනුව ශේෂය<br>රු. | වෙනස<br>රු. |
|---|---|---|---|
| අග්‍රිම ගිණුම් 27 ක් | 32,639,501 | 782,621,409 | 749,981,908 |
| පොදු තැන්පත් ගිණුම් 05 ක් | 8,577,358 | 11,585,610 | 3,008,252 |
| පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 10 ක් | 289,819,694 | 295,396,327 | 5,576,633 |
| අනෙකුත් අත්තිකාරම් ගිණුම් 04 ක් | 213,334,590 | 196,693,104 | 16,641,486 |
| ප්‍රේෂණ ගිණුම් 12 ක් | 4,155,638 | 28,389,772 | 24,234,134 |
| ආදායම් ගිණුම් 07 ක් | 371,323,994 | 374,351,393 | 3,027,399 |
| | | | 802,469,812 |

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

**පිළිතුරු නොලත් විගණන විමසුම්**

2012 මාර්තු 31 දිනට 2011 වර්ෂයට අදාලව විගණන විමසුම් 21 කටද ඉකුත් වර්ෂ වලට අදාලව විමසුම් 08 කටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1991 අංක 05 දරන බස්නාහිර පළාතේ සංශෝධිත මුදල් ප්‍රඥප්තියෙන් සංශෝධනය වූ 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ 102 (අ) වගන්තිය | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් / සේවකයින් සඳහා දිරි දීමනා ගෙවීමට අරමුදලක් ඇති නොකර වැය ශීර්ෂ ප්‍රතිපාදන වලින් දිරි දීමනා ගෙවා තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 1646 | පළාත් සභාවේ ආයතන 03 කට අයත් වාහන 11 කට අදාලව දෛනික ධාවන සටහන් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 | එක් නිලධාරියකුට හිමි උපරිම ආපදා ණය සීමාව වූ රු. 250,000 ඉක්මවා ආපදා ණය ගෙවා තිබූ අවස්ථා තිබුණි. |
| (ඇ) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.2 ඡේදය | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවය කරන හිමිකම් නොලබන නිලධාරීන්ට නිලවාහන වෙන්කර දී තිබුණි. |
| (ඉ) බස්නාහිර පළාත් මූල්‍ය රීති 455.2 | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ වටිනාකම රු. 1,442,872 ක් වූ භාණ්ඩ මිලට ගැනීම් අයිතම 16 ක් ගබඩා පොත්වල සටහන් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 3,918,439,938 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,080,890,676ක් විය.

### 2.2 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විචලනයන් සහිත සාරාංශයක් පහත දැක්වේ.

## ආදායම්

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| පළාත් සභා විෂයන්ට අදාල ආදායම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු ආදායම් | 19,952,560,000 | 21,669,946,772 | (1,717,386,772) | 21,104,800,000 | 19,488,605,804 | 1,616,194,196 |
| බදු නොවන ආදායම් | 1,855,488,000 | 2,847,472,906 | (991,984,906) | 2,364,326,000 | 3,252,368,241 | (888,042,241) |
| රජයේ ප්‍රදාන | 12,477,202,000 | 11,019,116,367 | 1,458,085,633 | 6,304,007,000 | 6,100,000,000 | 204,007,000 |
| එකතුව | 34,285,250,000 | 35,536,536,045 | (1,251,286,045) | 29,773,133,000 | 28,840,974,045 | 932,158,955 |

## වියදම්

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| වියදම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පෞද්ගලික පඩිනඩි | 19,817,031,248 | 19,100,569,969 | 716,461,279 | 17,456,239,180 | 17,300,622,747 | 155,616,433 |
| අනෙකුත් | 11,351,634,419 | 9,515,671,923 | 1,835,962,496 | 11,265,370,913 | 10,374,668,390 | 890,702,523 |
| පුනරාවර්තන | 31,168,665,667 | 28,616,241,892 | 2,552,423,775 | 28,721,610,093 | 27,675,291,137 | 1,046,318,956 |
| ප්‍රාග්ධන | 3,577,020,333 | 3,001,854,215 | 575,166,118 | 4,391,106,907 | 3,120,036,986 | 1,271,069,921 |
| එකතුව | 34,745,686,000 | 31,618,096,107 | 3,127,589,893 | 33,112,717,000 | 30,795,328,123 | 2,317,388,877 |

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා මූලධන වියදම් අනුපාතය 10 :1 ක් විය.

## 2.3 ආදායම් පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසානයට හා ආසන්නතම ඉකුත් වර්ෂ දෙකක අවසානයට හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2011 | 2010 | 2009 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 1,426,690,111 | 1,897,917,733 | 1,272,584,733 |
| බදු නොවන ආදායම | 1,248,958,145 | 1,086,708,932 | 857,656,300 |
| | 2,675,648,256 | 2,984,626,665 | 2,130,241,033 |

## 2.4 මුල්‍ය පාලනය

බැංකු ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතන 02 ක බැංකු ගිණුම් 06 කට අදාලව බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(ආ) ආයතන 04 ක බැංකු ජංගම ගිණුම් 09 කට අදාලව ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ එකතුව රු. 154,954 ක් වූ චෙක්පත් 53 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතන 01 ක බැංකු ගිණුම් 03 කට අදාල හඳුනානොගත් හර රු. 23,970 ක් වූ අතර, බැර 44,424 ක් විය.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### 2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2011 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන**

| | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 2,170 | 2,053 | 117 |

| | | | |
|---|---|---|---|
| **තෘතීයක** | 829 | 656 | 173 |
| **ද්විතීයක** | 8,580 | 7,669 | 911 |
| **ප්‍රාථමික** | 4,770 | 4,552 | 218 |
| **එකතුව** | 16,349 | 14,930 | 1,419 |

**(ආ) පාසැල් කාර්ය මණ්ඩල**

| | **අනුමත** | **තථ්‍ය** | **පුරප්පාඩු** | **අතිරික්ත** |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු හා ගුරුභවතුන් | 34,736 | 32,882 | 1,854 | - |
| සුළු සේවක | 2,998 | 3,059 | - | 61 |
| සහාය කාර්ය මණ්ඩලය | 961 | 29 | 932 | - |
| | 38,695 | 35,970 | 2,786 | 61 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල ඉහල කළමනාකරණ තනතුරු ඇතුළු විවිධ තනතුරු වල සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් ආණ්ඩුකාරවරයාගේ / පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගෙන තිබු අතර, ඉහල ශ්‍රේණිවල පුරප්පාඩු තනතුරු වලට වැඩ බලන නිලධාරීන් පත් කිරීම දිගින් දිගටම සිදුව තිබුණි.

(ii) කොළඹ, ගම්පහ හා කළුතර සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල වල අනුමත කාර්‍ය මණ්ඩලයේ ගණකාධිකාරී තනතුරු නොමැති වුවද රාජකාරී ආවරණය / වැඩ බැලීමට 2002 වසරේ සිට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත පත්වීම් කර 2011 වසර සඳහා මසකට රු. 3,500 බැගින් එකතුව රු. 126,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(iii) මධ්‍යම රජයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂිකාවක් 2005 ඔක්තෝබර් සිට තාවකාලික පදනම මත පළාත් මාර්ග සංවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යාංශයට අනුයුක්ත කර මසකට රු. 2,000 ක ගමන් වියදම් දීමනාවක් පමණක් ගෙවා තිබුණි.

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 ලැබිය යුතු ගිණුම්

මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2004 හා 2005 වර්ෂ වලදී එකතු කර තිබු මාර්ග බලපත්‍ර ආදායම් රු. 31,878,082 ක් පළාත් සභා අරමුදලට බැරකිරීම සඳහා 2012 මැයි මාසය වන විටත් අදාල පළාත් අමාත්‍යාංශය වෙත එවා නොතිබුණි.

## 2.7 වාහන උපයෝජනය

කළුතර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයට අයත් ඩබල් කැබ් රථයක් රු. 877,700 ක ඇස්තමේන්තුවක් මත අළුත්වැඩියා කටයුතු සඳහා 2011 මාර්තු මාසයේ රත්මලාන යාන්ත්‍රික ඉංජිනේරු වෙත යවා තිබු නමුත් අළුත්වැඩියා නිමකර ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.8 ආර්ථික නොවූ ගණුදෙනු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2011 වර්ෂයේ පළාත් පාලන මැතිවරණයෙන් පළාත් පාලන ආයතන වලට පත්වූ මහජන නියෝජිතවරුන්, දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් 2011 අප්‍රේල් 21 දින පවත්වා මහජන නියෝජිතයින් 564 ක් වෙනුවෙන් සංග්‍රහ කටයුතු සඳහා රු.1,297,200 ක් වැයකර තිබු නමුත්, ඒ සඳහා මහජන නියෝජිතයින් 195 දෙනකු සහභාගී නොවීම නිසා එක් අයකුට රු. 2,300 බැගින් රු. 448,500 ක් අනාර්ථික වී තිබුණි.

(ආ) බරාව නැමැති ජෛව විවිධත්ව උද්‍යාන ව්‍යාපෘතිය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03කට අයත් රජයේ ඉඩම් අක්කර 450 ක් යොදවා ගැනීමට අපේක්ෂා කර 2009 වසරේ සිට 2012 අගෝස්තු දක්වා විවිධ කටයුතු වෙනුවෙන් රු. 9,164,303 ක් වැයකර තිබුණද, අදාල ඉඩම් වල නිදහස් කිරීම් අවලංගු කර සන්තකය ආපසු භාරගැනීමට ඉඩම් කොමසාරිස් විසින් 2011 පෙබරවාරි මාසයේදී තීරණය කර තිබුණි. ව්‍යාපෘතියෙන් ගංවතුර පාලනය කිරීම, ප්‍රදේශ වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම, පරිසර හිතකාමී ජීවන රටාවක් තහවුරු කිරීම, පාරම්පරික දැනුම හා සංස්කෘතික උරුමය සුරැකීම, කාබනික පොහොර භාවිතා කෙරෙන භෝග වගාව ප්‍රවර්ධනය කිරීම හා විදේශීය සංචාරකයින් ආකර්ෂණය කරගැනීම වැනි කරුණු අරමුණු කර ගෙන කර තිබුණද, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගත නොහැකි වී තිබුණි.

## 2.9 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

පළාත් සභාව ආරම්භයේ සිට වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ප්‍රධාන අමාත්‍යවරයාට පැවරී තිබූ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පරිපාලන හා ආර්ථික සංවර්ධන යන විෂයයන් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් 2009 මැයි මාසයේදී ප්‍රධාන ලේකම්ට පවරා තිබුණි. මෙහිදී ප්‍රධාන අමාත්‍ය ලේකම්ගේ විෂය පථයට අයත්ව තිබූ අමාත්‍ය මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා නිකුත් කිරීම ප්‍රධාන ලේකම්ට පැවරී තිබූ අතර, ප්‍රධාන ලේකම්, පළාත් භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාව නියෝජනය කරන බැවින් අමාත්‍ය මණ්ඩල රැස්වීම් මෙහෙයවීම හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවලට අත්සන් තැබීම මතභේදයට තුඩුදෙන්නක් බව නිරීක්ෂණය විය.

## 2.10 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් මෝටර් වාහනයක වාර්ෂික ආදායම් බලපත්‍රයක් ලබාගත හැකි වන පරිදි වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම පරිගණක ජාලගත කිරීමේ කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කර තිබූ නමුත් 2012 ජූලි අවසානය වන විටත්, මාලිගාවත්ත ප්‍රධාන කාර්යාලය, නාරාහේන්පිට මෝටර් රථ දෙපාර්තමේන්තු කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක පමණක් මෙම කටයුතු අවසන් කර තිබුණි.

(ආ) දින දෙකකදී නිකුත් කරන ලද වාර්ෂික ආදායම් බලපත්‍ර පිළිබඳව කළ නියැදි පරීක්ෂාවකදී වාහන 177 ක් වෙනුවෙන් ලැබී තිබූ වායු විමෝචන සහතික වලින් වාහන 84 ක් සඳහා ඉදිරිපත් කර තිබූ සහතික සාවද්‍ය ඒවා විය.

(ඇ) සමුපකාර සමිති පරීක්ෂක 11 "ආ" තනතුරකට 1994 සැප්තැම්බර් මාසයේදී බඳවාගෙන තිබූ නිලධාරියෙකු අවම සුදුසුකම් සපුරා නොතිබීම මත මූලික විමර්ශණයක් සිදු කිරීම සඳහා 2000 අගෝස්තු මාසයේදී නිලධාරියෙකුට පවරා තිබූ නමුත් ඒ පිළිබඳ පසු විපරම් සිදු නොකිරීම නිසා අවශ්‍ය නිර්දේශ ලබාගැනීමට නොහැකිවීමෙන් අදාල නිලධාරියා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම 2011 සැප්තැම්බර් දක්වා ප්‍රමාද වී තිබුණි.

(ඈ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සතුව තිබූ බැස්ටියන් මාවත මගී පර්යන්තයෙහි කළමනාකරණය ජාතික ගමනාගමන කොමිෂන් සභාවට පවරාගැනීම හේතුවෙන් 2011 වර්ෂයේ පිවිසුම් පත්‍ර ආදායම ලෙස ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් ලැබී තිබූ ආදායම රු. 7,067,359 ක් වුවද එහි සේවය කරන මගී ප්‍රවාහන අධිකාරියේ සේවකයින් සඳහා 2011 වර්ෂය තුල රු. 12,594,476 ක වියදමක් දරා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගුරු සේවයේ 1 පන්තියේ ගුරු මහත්මියක් තමාගේ තනතුර හා සේවාකාලය පිළිබඳ ව්‍යාජ තොරතුරු සඳහන් කර පේරාදෙණිය ජාතික අධ්‍යාපන පීඨයේ වෘත්තීය නිපුණතා සංවර්ධන පාඨමාලාව සඳහා අයදුම්කර තිබියදී 2008 සැප්තැම්බර් 09 සිට සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (බෞද්ධ ධර්මය) හා 2010 නොවැම්බර් 24 සිට සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා පත්කර තිබුණි.

(ඊ) "සුපසන් නිමිතෙර" නමින් වැඩසටහනක් ආරම්භකර එහි යාන්ත්‍රනය සැකසීමේ පුහුණු වැඩසටහන සඳහා 2010 හා 2011 වර්ෂවල රු. 2,167,540 ක්ද රැකියා විරහිත උපාධිධාරීන්ගේ හැකියා ප්‍රවර්ධන වැඩසටහන සඳහා 2011 වසරේදී රු.2,466,527 ක් ද වැයකර තිබූ අතර, පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පුහුණු වැඩසටහනේ සම්පත් දායකයකු ලෙස කටයුතු කල අයකුට දිනකට රු. 75,000 ක් බැගින් දින 03 ක් සඳහා 2010 වසරේදී රු. 225,000 ක්ද, දින 08 ක් සඳහා 2011 වසරේදී රු. 600,000 ක් ද ගෙවා තිබුණි.

(ii) රැකියා විරහිත උපාධිධාරීන් රැකියා අවස්ථා සඳහා යොමුකරවීම, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග එක්වී රැකියා අවස්ථා උත්පාදනය කිරීම, ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රැකියා විරහිත උපාධිධාරීන්ගේ දැනුම ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම මෙම වැඩ සටහනේ අරමුණු වී තිබුණද, ඒ සඳහා වු නිශ්චිත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වු බවට කරුණු නිරීක්ෂණය නොවුණි.

(iii) මෙම වැඩසටහනේ කටයුතු සඳහා ස්වේච්ඡාවෙන් කටයුතු කල නිලධාරියා වෙනුවට විශ්‍රාම ගිය නිලධාරියෙකු 2010 අගෝස්තු මාසයේදී කොන්ත්‍රාත් පදනම මත පත්කර මසකට රු. 10,000 බැගින් 2011 දෙසැම්බර් දක්වා රු. 160,000 ක් ගෙවා තිබුණි.

## 2.11 කාර්ය සාධනය

### 2.11.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ලැබී තිබූ ප්‍රතිපාදනය | වියදම | උපයෝජනය ඌන/(අධි) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i) උපමාන පාදක ප්‍රදාන | 660,000,000 | 688,305,872 | (28,305,872) |
| (ii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,231,250,000 | 1,220,118,003 | 11,131,997 |
| (iii) සාමුහික ප්‍රදාන | | | 9,877,032 |

| | | | |
|---|---|---|---|
| | 103,500,000 | 93,622,968 | |
| (iii) වෙනත් ප්‍රදාන | | | |
| ලෝක බැංකු ආධාර - අධ්‍යාපන | 94,312,000 | 81,523,487 | 12,788,513 |

## 2.11.2 පළාත් සංවර්ධන සැලැස්ම

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහාවු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 3,239.45 ක ඇස්තමේන්තු අගයකට වූ යෝජනා 6988 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| (අ) සම්පූර්ණයෙන් නිම කළ | 5984 | 699 | 6683 |
| (ආ) 50% කට වඩා අඩුවෙන් නිම කළ | 83 | 23 | 106 |
| (ඇ) 50% කට වඩා වැඩියෙන් නිම කළ | 106 | 04 | 110 |
| (ඈ) ආරම්භකර නොතිබූ | 85 | 02 | 87 |
| (ඉ) මත භේදයට/ ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 02 | - | 02 |
| | 6260 | 728 | 6988 |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2010 පළාත් සංවර්ධන වැඩ සටහන (පරිපූරක ඇස්තමේන්තු 11) යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩුගලකන්ද විශේෂ ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට ව්‍යාපෘති 10 ක් යටතේ රු. 16,648,539 ක් අනුමත වී තිබූ අතර, එයින් ව්‍යාපෘති 09 ක් 2011 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි. මේ යටතේ ක්‍රියාත්මක වූ රු. 14,445,699 ක් වූ මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 3 හි අතුරන ලද කොන්ක්‍රීට්, සම්මත සම්පීඩන ශක්තියෙන් යුක්ත නොවන බව හා කොන්ක්‍රීට් තට්ටුව අපේක්ෂිත ඝනකමින් යුක්ත නොවන බව රසායනාගාර පරීක්ෂණයකදී අනාවරණය වී තිබුණි.

(ආ) 2011 ජූලි මාසයේදී බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යාංශයට තාවකාලිකව පවරා තිබූ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථානයට අයත් මඩ පොකුණු, ජල ටැංකි හා සත්ත්ව අභිජනනාගාරයේ අළුත්වැඩියා හා නව ඉදිකිරීම් සඳහා 2011 වර්ෂයේදී රු. 9,512,887 ක්

වැයකර තිබූ නමුත්, පරීක්ෂණාගාරය හා අභිජනනාගාරය අදාල කටයුතු වලට නොයොදා ශ්‍රවණාගාරයක් ලෙස ප්‍රයෝජනයට ගැනීමට නියමිත බව වාර්තා වී තිබුණි.

(ඇ) වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ප්‍රතිපාදන සලසාගෙන වැය දැරිය යුතු ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් සඳහා පළාත් සංවර්ධන සැලැස්මේ උපමාන පාදක හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘති අංකයන් යටතේ ප්‍රතිපාදන සලසාගෙන වැය දැරූ අවස්ථා සැලකිය යුතු ප්‍රමාණයක් නිරීක්ෂණය විය.

## 2.11.3 අරමුණු වලට පටහැනි ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රමිත මට්ටම් තරඟයේදී දුර්වල ප්‍රමිත මට්ටමක පැවති මධ්‍යස්ථානයක ප්‍රමිතිය ඉහල නැංවීම සඳහා 2010 වර්ෂයේදී රජයෙන් ලැබී තිබූ රු. 300,000 ක මුදල එම මධ්‍යස්ථානයේ සංවර්ධනය සඳහා නොයොදා 2011 වර්ෂයේ ප්‍රමිත මට්ටමින් උසස් මධ්‍යස්ථාන 09 කට ත්‍යාග බෙදා දීමට තීරණය කර එම මුදලින් කොටසක් මධ්‍යස්ථාන සේවකයින්ට ත්‍යාග මුදල් වශයෙන් බෙදා දී තිබුණි.

(ආ) ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල ළමුන්ගේ සුභ සාධන කටයුතු වෙනුවෙන් පෞද්ගලික ආයතනයකින් හා පුද්ගලයෙකුගෙන් ලැබී තිබූ රු.60,000 ක මුදලක් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සුභ සාධන කටයුතු සඳහා යොදවා තිබුණි.

## 2.12 පළාත් පාලන බල මණ්ඩල කටයුතු අධීක්ෂණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් විගණනයේදී අනාවරණය වී ඇති කරුණු පළාත් පාලන බල මණ්ඩල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කර තිබුණි. තවද, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයා විසින් විගණන මතය ව්‍යාවනය කර ඇති අවස්ථා පිළිබඳ සමාලෝචිත වර්ෂය ඇතුළුව ආසන්න වසර 04ක තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විගණනය කළ පළාත් පාලන බල මණ්ඩල (මුල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | විගණන මතය ව්‍යාවනය කළ පළාත් පාලන බල මණ්ඩල (මුල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව |
|---|---|---|
| 2007 | 48 | 22 |
| 2008 | 48 | 22 |
| 2009 | 48 | 22 |
| 2010 | 48 | 13 |
| 2011 | 48 | 20 |

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව පළාත් පාලන බල මණ්ඩල 48 හි හිඟ ආදායම රු. 6,546,067,697 ක් විය.

(ඇ) පළාත් පාලන බල මණ්ඩල 12 ක නිලධාරින්ට / වෙනත් අයවලුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2011 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වල අගය රු. 29,737,305 ක් විය.

(ඈ) පළාත් පාලන බල මණ්ඩල වල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර / පවත්වා නොතිබුණි.

## 2.13 අභ්‍යන්තර විගණනය

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන වැඩ සටහන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.14 සංයුක්ත සැලැස්ම

2011 වර්ෂයෙන් ආරම්භක ඉදිරි වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.15 ක්‍රියාකාර් සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් සභාව සඳහා ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 2.16 විගණන හා කළමනාකරණ කමිටු

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත් සභාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

# 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් කළමනාකරණය

(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම

(ඈ) අභ්‍යන්තර විගණනය

(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය

(ඊ) සේවක මණ්ඩල